රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | 76/1/15/18(I) XVIII වෙළුම | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.11.01 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම් / උසස් කිරීම්වලට අදාළව සේවා ව්‍යවස්ථාවල සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල වලංගුභාවය තහවුරු කර ගැනීම**

**(ශ්‍රී ලංකා පරිපාලන සේවය)**

සේවා ව්‍යවස්ථාවල සඳහන් පත් කිරීම් / උසස් කිරීම්වලදී සුදුසුකම් සනාථ කිරීම සඳහා නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතික, අදාළ තනතුරේ පරිපාලන බලධාරිත්වය දරනු ලබන අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එම සහතික නිකුත් කරන ලද ආයතනයෙන්ම සනාථ කර ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට එම කොමිෂන් සභාව තීරණය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/HB/26/2023 හා 2023.08.25 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

02. ඒ අනුව මින් ඉදිරියට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට සහ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිතව සිටින නිලධරයින්ගේ පශ්චාත් උපාධි අදාළ විශ්වවිද්‍යාලවලින් සනාථ කර ගැනීම සඳහා, පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ පසු එම සහතිකපත් අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.) වෙත කඩිනමින් යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. ඒ සඳහා යොමු කළ යුතු ලිපිලේඛන පහත පරිදි වේ.

- පශ්චාත් උපාධියට අදාළ උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල සහතිකයේ සහතික කරන ලද පිටපත්
- විදේශ විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි සනාථ කර ගැනීම සඳහා අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කිරීමට විශ්වවිද්‍යාල පරිපාලනය අමතමින් සකස් කරන ලද නිලධරයාගේ ඉල්ලීම් ලිපියක්

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / வெப்தளம் / Website: www.pubad.gov.lk

(සැලකිය යුතුයි : විශ්වවිද්‍යාලවලින් උපාධි සහතික සනාථ කර ගැනීමේදී මුදල් අයකිරීමක් සිදු වන්නේ නම් එම මුදල ගෙවීම් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඉදිරියේදී ඔබ දැනුවත් කරන බව කාරුණිකව සටහන් කරමි.)

03. 2024.01.01 දිනැතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට සහ 2024.01.02 දිනැතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම සඳහා අයදුම්කිරීමට අපේක්ෂිත, අංක:1842/2 හා 2013.12.23 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ පිළිවෙලින් 13.3.(අ) හි (i) වගන්තිය සහ 13.2.(අ) හි (i) වගන්තිය ප්‍රකාරව පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ඇති නිලධරයින්ගේ උපාධියට අදාළ උක්ත ලිපිලේඛන 2023.11.30 දිනට පෙර පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.)
ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.



පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
දුරකතන : 011-2698605
ෆැක්ස් : 011-2683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com